**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 08 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) හියුම් පයිප්ප මිලදී ගැනීම සඳහා වැයකර තිබූ රු.17,716 ක් සහ මාර්ග ඉදිකිරීම සඳහා වැය කර තිබූ රු.1,047,662 ක් පුනරාවර්තන වියදම් ලෙස වැය ශීර්ෂ 304-4 යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ආයෝජනය කර තිබූ සේවක ඇප රු.60,000 ක් ගිණුම් තැබීමේදී ආයෝජන ගිණුම හර කර මුදල් ගිණුම බැර කිරීම වෙනුවට සේවක ඇප ගිණුම හර කර මුදල් ගිණුම බැර කර තිබීම නිසා සේවක ඇප ගිණුමේ ශේෂය හා සේවක ඇප ආයෝජන ගිණුමේ ශේෂය ගිණුම්වලින් ඉවත්වී තිබුණි.

(ඇ) 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඈ) වැඩසටහන් 03 හි වැය ශීර්ෂ 304 ට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබූ සහ ගෙවිය යුතු වියදම රු.2,420,603 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමේ රු.2,825,433 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) ඉන්ධන පිරවුම්හලට ලබාදී තිබූ රු.50,000 ක තැන්පතුව, තැන්පත් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට අත්තිකාරම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඊ) ලංකා බැංකු ජංගම ගිණුමට බැර වී තිබූ රු.16,000,000 ක් සහ බැංකු අයිරා ගාස්තු හා චෙක්පත් ගාස්තු රු.4,100 ක් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය රු.5,376,683 ක් වුවද, සේවක ණය උපලේඛනය අනුව ශේෂය රු.5,223,551 ක් වූයෙන් රු.153,132 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.27,175,543 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,292,960 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) ශේෂ ඉදිරියට ගෙන එමින් සකස් කළ තැන්පත් ලේඛන නොමැතිවීම නිසා රු.2,281,331 ක් වූ තැන්පත් ශේෂ දෙකකද, ගෙවිය යුතු හා ලැබිය යුතු සියළුම ශේෂයන් දැක්වෙන පරිදි පවත්වාගෙන යනු ලබන ණයගැති හා ණයහිමි ලේඛන නොමැතිවීම නිසා රු.3,995,234 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය හා රු.978,387 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) කර්මාන්ත ණයගැති ගිණුමට හර කර සමුච්චිත අරමුදල බැර කර තිබූ රු.892,392 හි වටිනාකම සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 396(ඈ) | 2010 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ රු.17,496 ක් වූ චෙක්පත් 08 සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව පැවැත්විය යුතු භාණ්ඩ සමීක්ෂණ 2006 වර්ෂයෙන් පසු පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,900,751 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,939,339 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 අනුව චෙක්පත් මගින් ගෙවීම් කිරීමේදී පවතින බැංකු ශේෂය අදාල ගෙවීම් සඳහා ප්‍රමාණවත්දැයි සොයා බලා චෙක්පත් ලිවිය යුතු වුවත් ඊට පටහැනිව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ එක් බැංකු ජංගම ගිණුමකට අදාලව 2010 ජූලි 02 සිට 15 දක්වා සහ 2010 දෙසැම්බර් 12 සිට 16

දක්වා කාලය තුළ බැංකු අයිරා තත්ත්වයක් ඇතිවන ලෙස චෙක්පත් ලියා තිබුණි. බැංකුව විසින් බැංකු අයිරා පොලී හා ගාස්තු ලෙස රු.6,083 ක් අයකර තිබුණි.

(ආ) එක් ආදායම් විෂයයක හා වියදම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම්වල 13% සිට 53% දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර, ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම්වල 14% සිට 47% දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය වූයෙන් සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 2,361 | 1,141 | 4,633 | 2,610 | 710 | 5,955 |
| (ii) | බදු කුලී | 260 | 149 | 258 | 251 | 170 | 209 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 104 | 848 | 594 | 103 | 97 | 42 |
| (iv) | වෙනත් ආදායම් | 12,765 | 279 | 10,182 | 4,081 | 3,944 | 505 |

### 2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 03 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.3,706,724 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 **මුද්දර ගාස්තු**

----------------

2010 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා මතුගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අයකර පළාත් පාලන කොමසාරිස් වෙත එවා තිබූ මුද්දර ගාස්තු රු.1,300,801 ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:4 **හිඟ ආදායම් අයකරගැනීම**

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2005 හා 2008 වර්ෂවල එළහරක් මස් කඩය කුලියට දීමෙන් රු.38,322 ක්ද, පොදු වෙළඳ පොල 02 ක කඩ කාමර 30 කින් 1999 සිට 2010 දක්වා වර්ෂවලට අදාල කඩකුලී රු.198,921 ක්ද, 2006 සිට 2008 දක්වා තාවකාලික කඩ සඳහා බිම් කොටස් බදු දීමෙන් රු.21,030 ක්ද වූ හිඟ ආදායම් විගණිත දිනය වූ 2011 ජූලි 13 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර බදු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ අක්කර බදු බිල් කිරීම රු.87,419 ක් වූ අතර, ඉන් රු.66,488 ක් අයවී තිබුණද, වර්ෂ ගණනාවක සිට අක්කර බදු නොගෙවීම නිසා 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ශේෂය රු.1,116,704 ක් විය.

2:3:5 **බැකෝ ලෝඩර් යන්ත්‍ර කුලී**

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) බැකෝ ලෝඩර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබා ගෙන තිබූ රු.5,000,000 ක ණය මුදල පියවීම සඳහා මාසයකට රු.176,000 ක මාසික යන්ත්‍ර කුලී ආදායමක් අපේක්ෂා කර තිබුණද 2009 සිට 2010 අගෝස්තු දක්වා යන්ත්‍ර කුලී වශයෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) ව්‍යාපෘති වාර්තාව අනුව 2009 වර්ෂයේ මීටර් පැයක් සඳහා රු.2,200 ක්ද, පසුව සැම අවුරුද්දකටම වරක් 10% කින් කුලිය වැඩි කළ යුතු බව දක්වා තිබුණද, 2010

අගෝස්තු මාසයේදී පැයක කුලිය රු.1,800 දක්වා අඩුකර දෙසැම්බර් දක්වා පැය 78 ක් සඳහා යන්ත්‍රය කුලියට දී රු.140,400 ක ආදායමක් අයකර තිබුණි.

2:3:6 **ඉඩම් විකිණීම මත බදු**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව සභා සීමාව තුල පිහිටි ඉඩමක් වෙන්දේසියේ විකිණීමේදී පිරිවැටුම මත 1% ක බදු අයකිරීම වෙනුවට ඇස්තමේන්තුගත වටිනාකමට සභාපතිවරයාගේ නිර්දේශය මත බදු මුදල් අයකර තිබුණි. ඒ අනුව 2008, 2009 හා 2010 වර්ෂවලදී සභාව රු.1,509,660 ක බදු අයකරගෙන තිබුණි.

(ආ) 2008 නොවැම්බර් 22 දින අනුමත කරන ලද හෙට්ටියාගොඩවත්ත ඉඩමෙන් පොදු පහසුකම් සඳහා වෙන්කර තිබූ පර්චස් 30.7 ක ඉඩම් කැබැල්ලේ ඔප්පුව විගණිත දිනය වූ 2011 ජූලි 13 වන විටත් සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 20,532 | 20,001 | 531 | 21,056 | 19,169 | 1,887 |
| අනෙකුත් | 18,375 | 13,315 | 5,060 | 10,978 | 24,033 | (13,055) |
| උප එකතුව | 38,907 | 33,316 | 5,591 | 32,034 | 43,202 | (11,168) |
| ප්‍රාග්ධන වියදම | 12,649 | 9,523 | 3,126 | 1,630 | 4,605 | (2,975) |
| මුළු එකතුව | 51,556 | 42,839 | 8,717 | 33,664 | 47,807 | (14,143) |

2.5 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 02 |
| ද්විතීයික | 12 | 10 |
| ප්‍රාථමික | 68 | 66 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 14 |

## 2.6 **වත්කම් කළමනාකරණය**

### 2.6.1 **නිෂ්ක්‍රීය භෞතික සම්පත්**

2010 ජනවාරි මාසයේ සිට අක්‍රීයව පැවති බොබ්කැට් යන්ත්‍රය සහ 2011 ජනවාරි සිට අක්‍රීයව පැවති ජෙනරේටරය විගණිත දිනය වූ 2011 ජූලි වන විටත් අළුත්වැඩියා කර පාවිච්චියට ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.6.2 **ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 15,358,026 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.230,897 ක් විය.

### 2:6:3 **නිරවුල් නොවූ ගනුදෙනු**

1981 සිට 2006 දක්වා අවස්ථා 25 කදී ලබාදී තිබූ රු.173,523 ක් වූ අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371(අ) විධිවිධාන අනුව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත්, 2004 වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාල සහික දීමනා රු.46,220 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

### 2.6.4 **අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.5,376,683 ක් විය.

2.6.5 **සමීක්ෂණය නොකළ වත්කම්**

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු. 29,435,328 ක් විය.

2.7 **විදුලි භාණ්ඩ තොග පාලනය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) විදුලි භාණ්ඩ මිලදී ගැනීමේද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිල ගණන් කැඳවා මිලදී ගැනීම් සිදුකළ යුතු වුවද, 2008 වර්ෂයේ සිටම මිල කැඳවීමකින් තොරව එකම ආයතනයකින් මිලදීගෙන තිබූ අතර, 2010 වර්ෂයේදී එසේ මිලදී ගෙන තිබූ විදුලි භාණ්ඩවල වටිනාකම රු.1,828,060 ක් විය.

(ii) සභා බල ප්‍රදේශයේ වීථි ලාම්පු සවිකරන විදුලි කණු අංක කර නොතිබුණි.

(iii) විදුලි භාණ්ඩ / උපකරණ / විදුලි බුබුළු නිකුත් කිරීමේදී ඒවා සවිකරනු ලබන ස්ථාන සඳහන් කර නොතිබූ අතර, ඒ පිළිබඳව වාර්තාද නොතිබුණි.

(iv) 2010 ජනවාරි 18 දින සිට 2010 දෙසැම්බර් දක්වා අවස්ථා 19 කදී නිකුත් කර තිබූ වටිනාකම රු.180,940 ක් වූ විදුලි භාණ්ඩවලට අදාල නිකුතු නියෝග සඳහා වැඩ අධිකාරි / කාර්මික නිලධාරි / කාර්ය භාර නිලධාරි හෝ වෙනත් නිලධාරියෙකුගේ ඉල්ලීම් සටහන් වී නොතිබූ අතර, සභාවේ ලේකම්වරයාගේ නිර්දේශයද ලබා නොමැතිව භාණ්ඩ නිකුත් කර ගබඩා නිලධාරි විසින් භාණ්ඩ නිකුත් කළ බවට අත්සන් තබා ද නොතිබුණි.

(v) විදුලි භාණ්ඩ අළුතින් සවිකිරීමේදී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ ගබඩාවට භාරදීමේ වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

(vi) තොග ලේඛනයේ සටහන් පැන්සලින් ලියා තිබුණි.

2.8 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1995 මැයි මාසයෙන් පසු සභාව සතු සහ සභාවට පවරා දී තිබූ මාර්ග, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21(2) වගන්තිය ප්‍රකාරව ගැසට් කර ප්‍රකාශයට පත් කර නොතිබූ අතර, ඒවායේ ස්වභාවය අනුව හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ යෙදී සිට ස්ථාන මාරුවී ගොස් සිටි නිලධාරීන් 22 කගෙන් අයවිය යුතුව තිබූ රු.57,417 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට විගණිත දිනය වූ 2011 ජූලි වනවිටත් කටයුතු කර නොතිබුණි.

2.9 **අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128, 132, 134 සහ 2008 අගෝස්තු 19 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක WP/LGD/10/2008 දරන චක්‍රලේඛයේ (ඇ) ජේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය